# ගෞතම බුදු රජාණන් වහන්සේ

ගෞතම සිද්ධාර්ථ බෝසතාණෝ බුද්ධත්වයට පත්වූයේ වෙසක් පොහෝ දිනකය. බුද්ධ යනු සත්‍යාවබෝධය යි. මෙම වෙසක් පුර පසළොස්වක පොහෝ දිනයත් සමග 2600 වන බුද්ධ ජයන්තිය උදාවෙයි. එම අසිරිමත් අවස්ථාව ලොවපුරා බෞද්ධ ජනතාව සැමරීම ට සූදානම් වෙති. *ඔබ* සමග එක්ව කෙටි ලිපි පෙළකින් එය මෙසේ සමරමු.

*කිං කුසල ගවේසී* සත්‍ය ගවේෂණයෙහිලා සිත නැඹුරු විය. බෝසතාණන් වහන්සේ රජසැප හැරදමා එමගට පිළිපන්නේ විසිනව වන වියේදී ය. ආලාර කාලාම, උද්දක රාමපුත්‍ර තාපස වරුන් සමග ධ්‍යාන වැඩූහ. සමාධි සිත කෙලෙසුන් ගේ ක්ෂය වීම නොවන බව අවබෝධ විය. තවද දුෂ්කර ව්‍රතවල යෙදීමෙන් ඵලක් නොවන බව වැටහිණි. එබැවින් මධ්‍යම ප්‍රතිපදාවට එළඹ හේතු-ඵල දහම අවබෝධයෙහිලා වීර්ය වැඩූහ. වෙසක් පුන් පොහෝ දින බුද්ධ ගයාවේ බෝධි මූලයේදී සියලු කෙලෙසුන් නසා බුද්ධත්වයට පත්වූහ. එදවස පටන් බෝසතාණන් වහන්සේ ගෞතම බුදුන් වහන්සේ නමින් ප්‍රකට වූහ.

බුදුන් වහන්සේ අපගේ ශාස්තෘවරයාණෝ ය. උන් වහන්සේ දැකීම අප අපම කළ යුතුය. දේශිත ශ්‍රී සද්ධර්මය එයට මාර්ගයයි. වරෙක සච්චක නම් නිගණ්ඨ පුත්‍ර ට බුදුන් වහන්සේ මෙසේ වදාළහ. ”ඒ භාග්‍යවතුන් වහන්සේ සියුසස් දහම (නිවන) අවබෝධ කළසේක. අන් අයට ද අවබෝධය පිණිස දහම් දෙසන සේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඉඳුරන් දමනය කළසේක. අන් අයටද ඉඳුරන් දමනය පිණිස දහම් දෙසන සේක. ඒ භාග්‍යවතුන් වහන්සේ කෙලෙසුන්ගෙන් සන්සිඳුනාහු ශාන්ත භාවයට පත්වූ සේක. අන් අයටද ශාන්ත භාවයට පත්වීම පිණිස දහම් දෙසන සේක. ඒ භාග්‍යවතුන් වහන්සේ සසර සයුරු තරණය කළසේක. අන් අයටද සසර සයුරු තරණය පිණිස දහම් දෙසන සේක. ඒ භාග්‍යවතුන් වහන්සේ කෙලෙස් පිරිනිවෙනින් පිරිනිවුන සේක. අන් අයටද පිරිනිවීම පිණිස දහම් දෙසන සේක. විමුක්ති සිත් ඇති භික්ෂුව මෙසේ ගරුකාර මානන පූජන කෙරෙයි.”

බුදුන් වහන්සේ ගේ ඉහත ප්‍රකාශයෙන් උන් වහන්සේ අද්භූත පුද්ගලයෙකු නොවන බව ප්‍රකට වේ. තථාගතයන් වහන්සේට ගරු බුහුමන් දක්වනු ලබන්නේ අපගේ සැනසීම සහ නිවීම පිණිස මාර්ගය කියාදෙන ගුරුවරයා ලෙසටය. (තුම්මෙහි කිච්චං ආතප්පං - අක්ඛාතාරෝ තථාගතා )

ධර්ම මාර්ගයට පිවිසෙන්නා පළමුව බුදුන් වහන්සේ දැකිය යුතුය. දැකීම නම් ශ්‍රද්ධාවයි. ශ්‍රද්ධාව ලැබිය යුත්තේ අවබෝධයෙනි. සද්ධහති තථාගතස්ස බෝධිං. එනම් තථාගතයන් වහන්සේගේ අරහං ආදී බුදුගුණ දැකීමයි. බුදු සිරිතෙන් හා දේශිත දහමින් ජීවරූපී තථාගතයන් වහන්සේ හදවත නම් වූ පූජාසනය මත බුහුමනට ලක්වීම ශ්‍රද්ධාවෙහි ආරම්භයයි. අවසානය ප්‍රඥාවයි. ශ්‍රද්ධාවෙන් ප්‍රඥාව කරා යාමට සේඛ ධර්මයෝ මහෝපකාරී වෙයි. එනම් ශ්‍රද්ධාව, ශීලය, ධර්ම ශ්‍රවනය, පරිත්‍යාගය, ධර්මාවබෝධය යන සේඛ ධර්ම ප්‍රගුණ කළ යුතුය.

ප්‍රාර්ථනා කිරීමෙන් පමණක් ධර්මාවබෝධය ට තබා බ්‍රහ්ම සහවාසයටවත් පිවිසිය නොහැකි බව බුදුන් වහන්සේ වදාළහ. "මහණෙනි, කිකිළියක බිත්තර රැකීමේදී පැටවුන් මෙසේ ඇතිවිය යුතුයයි අදහසක් නොමැත. නිසිකල්හි පැටවි නිය තුඩින් හෝ හොටින් කටුව බිඳගෙන බිහිවෙති. එනයින්ම ධර්මය ප්‍රගුණ කරන්නා කරා සැනසීම සහ නිවීම ළඟාවේ."

මෙයින් ගම්‍ය වන්නේ ධර්මයෙහි හැසිරීම ධර්මාවබෝධය ට ප්‍රවිශ්ට වන මාර්ගය වන බවයි. එයින් ලබන විඳීම හෙවත් සැනසීම යනු බුදුන් වහන්සේ දැකීමයි.

---------------------------------------------

ශාස්ත්‍රපති පල්ලෙවෙල දේවරක්ඛිත ස්වාමීන් වහන්සේ

විහාරාධිපති, පාරමිතා බෞද්ධ විහාරය

රොක්බෑන්ක්